# NAPLAN (නැප්ලෑන්) දෙමාපියන් සහ රැකබලා ගන්නන් සඳහා තොරතුරු 2023

## සිසුන් NAPLAN පරීක්ෂණයට පෙනී සිටින්නේ ඇයි?

NAPLAN යනු 3, 5, 7 සහ 9 වසරවල සිසුන් සෑම වසරකම පෙනී සිටින සාක්ෂරතාවය සහ අංක ශාස්ත්‍රය පිළිබඳව ජාතික මට්ටමෙන් කෙරෙන ඇගයීමකි. සියලුම ඕස්ට්‍රේලියානු සිසුන්ට පෙනී සිටීම සඳහා අවස්ථාව ලැබෙන එකම ජාතික තක්සේරුව එයයි.

සිසුන් තම පාසල් වසරවල අධ්‍යාපන කටයුතු කෙරීගෙන යන විට, කියවීම, ලිවීම සහ අංක ශාස්ත්‍රය පිළිබඳ අත්‍යවශ්‍ය කුසලතා ඔවුන් කෙතරම් හොඳින් වර්ධනය කර ගන්නේද යන්න පරීක්ෂා කිරීම වැදගත් වේ.

NAPLAN මඟින් පාසල් විෂයමාලාව හරහා සිසුන් වර්ධනය කර ගන්නා සාක්ෂරතාවය සහ අංක ශාස්ත්‍රය සම්බන්ධ කුසලතා තක්සේරු කරන අතර තම දරුවා ජාතික ප්‍රමිතීන්ට ප්‍රතිමුඛව සහ කාලයත් සමඟ ඉදිරියට යන ආකාරය දැක ගැනීමට දෙමාපියන්ට / රැකබලා ගන්නන්ට ඉඩ සලසයි.

NAPLAN යනු පාසලේ ඇගයුම් සහ වාර්තා කිරීමේ ක්‍රියාවලියේ එක් අංගයක් පමණි. එය ශිෂ්‍ය කාර්ය සාධනය පිළිබඳව ගුරුවරුන් විසින් දිගටම සිදු කරන ඇගයුම් ප්‍රතිස්ථාපනය නොකරයි. නමුත් එමඟින් සිසුන්ගේ අධ්‍යාපන ප්‍රගතිය පිළිබඳ අමතර තොරතුරු ගුරුවරුන් වෙත සැපයිය හැකිය.

අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක වන ආකාරය සහ තරුණ ඕස්ට්‍රේලියානුවන් සාක්ෂරතාවය සහ අංක ශාස්ත්‍රය සම්බන්ධව වැදගත් අධ්‍යාපන ප්‍රතිඵල අත්කර ගන්නේද යන්න පිළිබඳ තොරතුරු NAPLAN මඟින් පාසල්, අධ්‍යාපන බලධාරීන් සහ රජයන් වෙත ලබා දෙයි.

## ඔබේ දරුවා NAPLAN පරීක්ෂණ මාර්ගගතව සිදු කරනු ඇත

කඩදාසි පාදක ඇගයුම් සිට පරිගණක පාදක ඇගයුම් වෙත පාසල් සංක්‍රමණය වී ඇත. 3 වසරේ සියලුම සිසුන් ලිවීම පිලිබඳ ඇගයුම් පත්‍රිකා භාවිතයෙන් දිගටම කරගෙන යනු ඇත.

මාර්ගගත NAPLAN පරීක්ෂණ වඩාත් නිවැරදි ප්‍රතිඵල සපයන අතර ඒවා සිසුන් සඳහා වඩාත් ආකර්ෂණීය වේ. එක් ප්‍රධාන ප්‍රතිලාභයක් වන්නේ එය මනාව සැකසු (හෝ අනුවර්තක) පරීක්ෂණයක් වීමය. එහිදී පරීක්ෂණය ශිෂ්‍යයාගේ ප්‍රතිචාර මත පදනම්ව අඩු හෝ වැඩි වශයෙන් දුෂ්කර විය හැකි ප්‍රශ්න ඉදිරිපත් කරයි.

මනාව සකස් කරන ලද පරීක්ෂණය මඟින් පුළුල් පරාසයක ශිෂ්‍ය හැකියාවන් තක්සේරු කිරීමට සහ ශිෂ්‍ය සාධනය වඩාත් නිවැරදිව මැනීමට ඉඩ සලසයි. ශිෂ්‍යයෙකුගේ සමස්ත NA-PLAN ප්‍රතිඵලය ඔවුන් නිවැරදිව පිළිතුරු දෙන ප්‍රශ්න සංඛ්‍යාව සහ ඒවායේ සංකීර්ණත්වය යන දෙකම මත පදනම් වේ. ප්‍රශ්න අභියෝගාත්මකයැයි ඔබේ දරුවාට දැනෙන්නේ නම්, ඒ ගැන ඔවුන් සැලකිලිමත් නොවිය යුතුය; ඔවුන් වඩාත් සංකීර්ණ පරීක්ෂණ මාවතක් වෙත යොමු වෙනවා විය හැකිය.

## NAPLAN මඟින් ඇගැයීමට ලක් කරන්නේ කුමක්ද?

NAPLAN මඟින් සිසුන් තම සාමාන්‍ය පාසල් විෂය මාලාව හරහා වර්ධනය කර ගන්නා සාක්ෂරතාවය සහ අංක ශාස්ත්‍රය සම්බන්ධ කුසලතා තක්සේරු කරයි.

සිසුන් ලිවීම, කියවීම, භාෂාවේ සම්මුතීන් (අක්ෂර වින්‍යාසය, ව්‍යාකරණ සහ විරාම ලකුණු) සහ අංක ශාස්ත්‍රය පිලිබඳ තක්සේරු කිරීම් සඳහා පෙනී සිටිති. ප්‍රශ්න මඟින් ඕස්ට්‍රේලියානු විෂය මාලාවට සම්බන්ධ ඉංග්‍රීසි සහ ගණිත අන්තර්ගතය ඇගැයීමට ලක් කරයි.

සියලුම රාජ්‍ය සහ රාජ්‍ය නොවන අධ්‍යාපන බලධාරීන් NAPLAN පරීක්ෂණ විෂයන් සංවර්ධනය කිරීම සඳහා දායකත්වයක් ලබා දෙති.

NAPLAN පිළිබඳ වැඩිදුර දැන ගැනීමට, **nap.edu.au** වෙත පිවිසෙන්න

## NAPLAN පරීක්ෂණය සඳහා සහභාගීත්වය

NAPLAN පරීක්ෂණය සෑම කෙනෙකු සඳහා වේ. සියලුම සිසුන්ට ජාතික තක්සේරු කිරීමේ වැඩසටහනට සහභාගී වීමට හැකි වන පරිදි අන්තර්ගත පරීක්ෂණ සඳහා ACARA ආයතනය සහාය දක්වයි.

විවිධ ක්‍රියාකාරී හැකියාවන් සහ අවශ්‍යතා ඇති අබාධිත සිසුන් සඳහා පිළිසැකසුම් ලබා ගත හැකිය.

NAPLAN පරීක්ෂණයට ප්‍රවේශ වීමට අබාධිත තනි පුද්ගල සිසුන් සඳහා අවශ්‍ය සාධාරණ සැකසුම්, එක් එක් සිද්ධිය අනුව, හඳුනා ගැනීමට පාසල් දෙමාපියන්/රැකබලා ගන්නන් සහ සිසුන් සමඟ කටයුතු කළ යුතුය. පන්තිකාමරයේ කෙරෙන ඇගයුම් සඳහා සාමාන්‍යයෙන් ලබාදෙන සහාය සැකසුම් මඟින් පිළිබිඹු විය යුතුය.

මෙම තීරණ දැනුම් දීමට උපකාරී වීම සඳහා, ඔබට **NAPLAN පොදු නිරූපන අඩවිය, NAPLAN වෙත ප්‍රවේශ වීමට ආබාධිත සිසුන්ට උපකාර කිරීමට පාසල් සඳහා ලබාදෙන මාර්ගෝපදේශය, හෝ NAPLAN සැකසුම් භාවිතා කිරීම පිලිබඳව දෙමාපියන්/රැකබලා ගන්නන්, ගුරුවරුන් සහ ශිෂ්‍යයන් ඔවුන්ගේ අත්දැකීම් බෙදාගන්නා ආකාරය පෙන්නුම් කරන අපගේ වීඩියෝ මාලාව** විමසා බැලිය හැකිය.

සුවිශේෂී අවස්ථා වලදී, තක්සේරුව සඳහා සහභාගී වීමට ඇති හැකියාව දැඩි ලෙස සීමා කරන ආබාධයක් සහිත ශිෂ්‍යයෙකුට, හෝ මෑතකදී ඕස්ට්‍රේලියාවට පැමිණි ඉංග්‍රීසි නොවන භාෂාවක් කතා කරන පසුබිමක් ඇති ශිෂ්‍යයෙකුට විධිමත් විවර්ජනයක් ලබා දිය හැකිය.

අබාධිත සිසුන් සඳහා වන සැකසුම්හෝ විධිමත් විවර්ජනයක් ලබා ගැනීමට අවශ්‍ය ක්‍රියාවලිය පිළිබඳ වැඩිදුර තොරතුරු ඔබේ පාසල් විදුහල්පතිවරයාට සහ ඔබේ ප්‍රාදේශීය පරීක්ෂණ පරිපාලන අධිකාරියට ලබා දිය හැකිය.


Translation © VCAA

## NAPLAN පරීක්ෂණය පැවැත්නවෙන දින වලදී මගේ දරුවා පාසලට නොපැමිණෙන්නේ නම් කුමක් කළ යුතුද?

හැකි සෑම අවස්ථාවකදීම, පරීක්ෂණ සිදු කරන අවස්ථාවේ නොපැමිණෙන තනි පුද්ගල සිසුන්ට මඟ හැරුණු පරීක්ෂණ සම්පූර්ණ කිරීම සඳහා පාසලේ පරීක්ෂණ කාලසටහන තුළ වෙනත් වෙලාවක් පාසල්වලට ලබාදිය හැකිය.

## NAPLAN පැවැත්වෙන දිනවලදී මගේ පාසල වසා දැමුවහොත් කුමක් කළ යුතුද?

ප්‍රබල හේතු ඇති පාසල්වලට දින 9ක පරීක්ෂණ කවුළුවෙන් පසුව පරීක්ෂණ කාලසටහන් කිරීමට අවසර ලබා දිය හැකිය.

## මගේ දරුවාට උදව් කිරීමට මට කළ හැක්කේ කුමක්ද?

සිසුන් NAPLAN පරීක්ෂණය සඳහා පාඩම් කළ යුතු බව අපේක්ෂා නොකරයි. NAPLAN පරීක්ෂණය ඔවුන්ගේ පාසල් වැඩසටහනේ කොටසක් බව ඔවුන්ට සහතික කිරීමෙන් සහ ඔවුන්ට හැකි උපරිමය කිරීමට ඔවුන්ට මතක් කර දීමෙන් ඔබට ඔබේ දරුවාට උපකාරී විය හැකිය. NAPLAN පරීක්ෂණ පිළිබඳ යම් හුරුපුරුදු කිරීම් සහ පැහැදිලි කිරීම් සිසුන්ට පරීක්ෂණවල ආකෘතිය තේරුම් ගැනීමට සහ සුවපහසුවක් ලබා දීමට උපකාරී වේ. පරීක්ෂණවල අඩංගු ප්‍රශ්න වර්ග පිළිබඳව සිසුන් හුරුපුරුදු බව සහතික කිරීමට සහ සුදුසු සහාය හා මග පෙන්වීම ඔවුන්ට ලබා දීමට ගුරුවරු කටයුතු කරනු ඇත.

NAPLAN පරීක්ෂණය සඳහා අධික ලෙස සූදානම් වීම හෝ පෞද්ගලික ගුරුවරුන්ගේ සේවා භාවිතා කිරීම ACARA ආයතනය නිර්දේශ නොකරයි.

මාර්ගගත NAPLAN ඇගයුම් වල අඩංගු ප්‍රශ්න සහ මෙවලම් වර්ග **nap.edu.au/online-assessment/public-demonstration-site** වෙතින් දැක ගන්න

## NAPLAN කාලසටහන

NAPLAN පරීක්ෂණ කවුළුව දින 9කි. මෙය උපාංග අඩුවෙන් ඇති පාසල්වලට ඉඩ සැලසීම සඳහා ය.

NAPLAN පරීක්ෂණ කවුළුව මාර්තු 15 වැනි බදාදා ආරම්භ වන අතර 2023 මාර්තු 27වැනි සඳුදා අවසන් වේ. පළමු සතියට ප්‍රමුඛත්වය දෙමින්, පරීක්ෂණ කවුළුව තුළ පරීක්ෂණ හැකි ඉක්මනින් කාලසටහන්ගත කරන ලෙස පාසල්වලට උපදෙස් දෙනු ලැබේ.

## මගේ දරුවාගේ කාර්ය සාධනය වාර්තා කරන්නේ කෙසේද?

එක් එක් ඇගයුම සඳහා, තනි පුද්ගල ශිෂ්‍ය කාර්ය සාධනය ජාතික සාධන පරිමාණයෙන් පෙන්නුම් කරනු ලැබේ. එම වසර මට්ටමට සම්පූර්ණයෙන් සහභාගී වීමට අවශ්‍ය සාක්ෂරතාවය සහ අංක ශාස්ත්‍රය සම්බන්ධ අපේක්ෂාවන් ශිෂ්‍යයා සපුරාලන්නේද යන්න මෙම පරිමාණයෙන් පෙන්නුම් කරයි.

NAPLAN තනි පුද්ගල ශිෂ්‍ය වාර්තාවක් වසර අවසානයේදී ඔබේ දරුවාගේ පාසල විසින් ලබාදෙනු ඇත. ඔබට වාර්තාවක් නොලැබුණහොත්, ඔබ ඔබේ දරුවාගේ පාසල ඇමතිය යුතුය.

## NAPLAN ප්‍රතිඵල භාවිතා කරන්නේ කෙසේද?

- ගුරුවරුන් සමඟ ප්‍රගතිය සාකච්ඡා කිරීම සඳහා සිසුන්ට සහ දෙමාපියන්ට/රැකබලා ගන්නන්ට තනි පුද්ගල ප්‍රතිඵල භාවිත කළ හැකිය.
- වැඩි අභියෝග හෝ අමතර උදව් අවශ්‍ය සිසුන් හඳුනා ගැනීමට ගුරුවරු ප්‍රතිඵල භාවිත කරති.
- ඉගැන්වීම් වැඩසටහන් වැඩිදියුණු කිරීමට අවශ්‍ය ප්‍රබලතාවයන් සහ ක්ෂේත්‍ර හඳුනා ගැනීමට සහ සාක්ෂරතා සහ අංක ශාස්ත්‍ර ඉලක්ක සැලසුම් කිරීමට මෙම ප්‍රතිඵල පාසල් භාවිතා කරති.
- පාසල් වෙත ලබා දෙන වැඩසටහන්වල හා උදව්වල සඵලතාව සමාලෝචනය කිරීමට පාසල් පද්ධති මෙම ප්‍රතිඵල භාවිතා කරති.
- කාලයත් සමඟ පාසල්වල ක්‍රියාකාරිත්වය පිළිබඳ තොරතුරු **myschool.edu.au** වෙතින් ප්‍රජාවට දැක ගත හැකිය.

## වැඩිදුර තොරතුරු මට ලබාගත හැක්කේ කොතැනින්ද?

NAPLAN පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා:

- ඔබේ දරුවාගේ පාසැල අමතන්න
- **nap.edu.au/TAA** ඔස්සේ ඔබේ ප්‍රාදේශීය පරීක්ෂණ පරිපාලන අධිකාරිය අමතන්න
- **nap.edu.au** වෙත පිවිසෙන්න

NAPLAN පරීක්ෂණය සඳහා ACARA ආයතනය පුද්ගලික තොරතුරු හසුරුවන ආකාරය දැන ගැනීමට, **nap.edu.au/naplan/privacy** වෙත පිවිසෙන්න

| පරීක්ෂණය | කාලසටහන් අවශ්‍යතා | කාල සීමාව | පරීක්ෂණ විස්තරය |
|---|---|---|---|
| **ලිවීම** | • 3 වසරේ ශිෂ්‍යයෝ ලිවීමේ පරීක්ෂණය පත්‍රිකා භාවිතයෙන් සිදු කරති (පළමු දිනයේ පමණක්)<br>• 5, 7 සහ 9 වසර වල ලිවීමේ පරීක්ෂණය පළමු දිනයේ පටන් ගත යුතුය (පාසල් විසින් ලිවීම පළමු හා දෙවන දින අතර පමණක් නිම කිරීමේ ප්‍රමුඛතාව ලබා දිය යුතු අතර, 2 වැනි දිනය භාවිතා කළ යුත්තේ තාක්ෂණික/ප්‍රවර්ධන සීමාවන් පවතින විට පමණි) | 3 වසර: විනාඩි 40<br>5 වසර: විනාඩි 42<br>7 වසර: විනාඩි 42<br>9 වසර: විනාඩි 42 | සිසුන්ට 'ලිවීමේ දිරි ගැන්වීමක්' (සමහර විට 'මතක් කිරීමක්' - අදහසක් හෝ මාතෘකාවක් - ලෙස හැඳින්වෙන) ලබා දී විශේෂිත ශෛලියකින් (ආඛ්‍යාන හෝ සිත් ගන්න සුලු ලිවීමක්) ප්‍රතිචාරයක් ලියන ලෙස ඔවුන්ගෙන් ඉල්ලා සිටී. |
| **කියවීම** | • ලිවීමේ පරීක්ෂණයෙන් පසු සම්පූර්ණ කළ යුතුය<br>• භාෂා පරීක්ෂණයේ සම්මුතීන්ට පෙර සම්පූර්ණ කළ යුතුය | 3 වසර: විනාඩි 45<br>5 වසර: විනාඩි 50<br>7 වසර: විනාඩි 65<br>9 වසර: විනාඩි 65 | ශිෂ්‍යයෝ තොරතුරු අන්තර්ගත, පරිකල්පනාත්මක සහ ඒත්තු ගන්වන සුලු පාඨයන් පරාසයක් කියවා ඉන්පසු අදාළ ප්‍රශ්නවලට පිළිතුරු සපයති |
| **භාෂාවේ සම්මුතීන්** | • කියවීමේ පරීක්ෂණයෙන් පසුව සම්පූර්ණ කළ යුතුය | 3 වසර: විනාඩි 45<br>5 වසර: විනාඩි 45<br>7 වසර: විනාඩි 45<br>9 වසර: විනාඩි 45 | අක්ෂර වින්‍යාසය, ව්‍යාකරණ සහ විරාම ලකුණු තක්සේරු කරයි |
| **අංක ශාස්ත්‍රය** | • භාෂා පරීක්ෂණයේ සම්මුතීන්ට පසුව සම්පූර්ණ කළ යුතුය | 3 වසර: විනාඩි 45<br>5 වසර: විනාඩි 50<br>7 වසර: විනාඩි 65<br>9 වසර: විනාඩි 65 | අංකය සහ වීජ ගණිතය, මිනුම් සහ ජ්‍යාමිතිය, සහ සංඛ්‍යාලේඛන සහ සම්භාවිතාව තක්සේරු කරයි |